# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක:07/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 සැප්තැම්බර් මස 22 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයන්හි සේවය කිරීම වෙනුවෙන් පරිපාලන නිලධාරීන්ට මුදල් ගෙවීම</u>**

අනුපිළිවෙලින් 1997.04.01 සහ 1993.06.21 සහ දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක අංක 707 සහ 575 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

"රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයන්හි සේවය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම" පිළිබඳව 2013.10.09 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලන නිලධාරීන් සඳහා යොදා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 707 හි 2(අ) ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

(අ) නිලධාරියාදිනකට පැය අටකට (08) නොඅඩු කාලයක්වැඩ කළ යුතුය.

(ආ) ලිත්මාසයකට උපරිම දින දෙකක් (02) අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය මතසේවයේ යෙදවීමට හා ඒ අනුව අදාළ ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) ලිත් මාසයකට දින දෙකකට (02) වැඩි දින ගණනක් සේවයේ යෙදවීමට අවශ්‍ය වන්නේ නම් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් කළ යුතුය.

අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම පිණිස අදාළ උසස් අධ්‍යාපන ආයතනය /ආයතනය වෙත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ මෙම වියදම් කළමනාකරණය කර ගත යුතුය.

මෙම විධිවිධාන 2016.09.01 දින සිට ක්‍රියාත්මක වේ. කොමිෂන් සභා චක්‍රලේඛ අංක අංක 707 සහ 575 හි අනෙකුත් විධිවිධාන ඉහත සංශෝධනයන්ට යටත්ව නොවෙනස්ව පවතිනු ඇත.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරි /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් /සහකාර පුස්තකාලයාධිපතිවරුන්

11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාරලේඛකාධිකාරීවරුන් /සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවලජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/2/8